
# 07
# හවුල් නායකත්වය




දිවැසිවරුන් ගුරුවරුන් හා සභාව උපවාසයේ යෙදෙමින් සිටින විට " ශුද්ධාත්මයාණන් විසින් බාර්ණබස් හා සාවුල් කැඳවනු ලැබූ සේවයට වෙන් කරන්න" යැයි කැඳවීමක් ලැබිණි. මේ කැඳවීම ලැබුණේ අන්තියෝකිය සභාවේ දී ය. අන්තියෝකිය සභාව යනු මිශ්‍ර සභාවකි. විවධ ජාතීහු එහි වාසය කළහ. ඔවුහු උපවාසයේ යෙදී යාච්ඤා කර ඔවුන් හවුල් සේවයට අන්තියෝකියේ දී පිටත් කර හැරියහ. ජොහාන් නම් ලත් මාර්ක් ඔවුන්ගේ **සහකාරයා** විය.

ඔවුහු සිලුකියෙන් නැව් නැගී සලමිසයට පැමිණිය හ. අනතුරු ව ගොඩබිමින් පාපස් වෙත පැමිණ නැවත නැව් නැගී පම්පිලියේ පර්ගා වෙත පැමිණිය හ. අනතුරු ව අන්තියෝකිය ඉකෝනිය, ලුස්ත්‍රාව, දර්බය වෙත ගමන් කරමින් තම සාක්ෂිය ප්‍රකාශ කළහ. මෙහි දී සමහර ස්ථානවල විශේෂ සිදුවීම් සිදු විය. ( එය බයිබලය කියවා දැනගන්න) නමුත් ප්‍රධාන කොට අප මෙහි දී සළකා බලනු ලබන්නේ හවුල් නායකත්වයේ ක්‍රියාකාරිත්වය යි. මෙහි දී පාවුල් බාර්ණබස් හා යොහාන් මාර්ක් කිලෝ මීටර් 1816 පමණ ගමන් කරමින් දැරූ සාක්ෂිය ක්‍රියා 13 14 පරිච්ඡේද තුළ දැකිය හැකි ය. ක්‍රි ව 46 : 48 පමණ කාලය තුළ මෙය සිදු වූයේ යැයි සිතිය හැකි ය.

ප්‍රථම ධර්ම දූත ගමන



❖ පාවුල්ගේ පළමු වන ධර්ම දූත ගමන ( ක්‍රියා 13 : 14 )



**පාපස්** : බාර් යේසුස් අන්ධ වීම. ( ක්‍රියා 13 : 06  12 )
සාවුල් පාවුල් ලෙස නව ගිවිසුමේ සඳහන් වීම ඇරඹීම. (ක්‍රියා 13:09)

හවුල් නායකත්වය තුළ පාපස්වල ක්‍රියාකාරී වූ පාවුල් බාර්ණබස් හා යොහාන් මාර්ක්ට බාර් යේසුස් නම් ජුදෙව් ජාතික බොරු දිවැසිවර විජ්ජාකාරයකු හමු විය. ඔහු සිටියේ බුද්ධිමත් මිනිසකු වූ සර්ගියස් පාවුලස් නම් දේශාධිපතියා සමඟ ය. ඒ අධිපති තෙමේ පාවුල් හා බාර්ණබස්ගේ වචන අසන්නට කැමති වුව ද ඔහුගේ හවුල්කාරයා වූ බාර් යේසුස් ඔහු ව වළකාලී ය.

මෙසේ යහපත් වීමෙන් ම අයහපත් හවුල් නායකත්වයක් දැකිය හැකි ය. සමහරු හවුල් නායකත්වය තුළ යහපත් දේවලට මඟ පෙන්වන අතර සමහරු අයහපත් දේවලට මඟ පෙන්වයි. බාර් යේසුස් මෙහි දී සත්‍ය වසන් කිරීමට මඟ පෙන්වන ලදී. මෙහි දී යහපත් හෝ අයහපත් දේ තෝරා බේරා ගැනීමට කෙනෙකුට හැකි විය යුතු ය.(වැඩි විස්තර සඳහා ක්‍රියා 13 : 04  12 දක්වා කියවන්න. )

**පර්ගය** : යොහාන් , මාර්ක් හැරී යාම.

මෙහි දී හවුල් නායකත්වය ආරම්භ කළ අවස්ථාවේ ම අතර මඟ නතර කිරීමක් සිදු වීමකි. නමුත් ඉන් පසුබට නොවී බාර්ණබස් හා පාවුල් හවුල් නායකත්වය ඉදිරියට ම ගෙන ගියහ.

ක්‍රි 13 : 13 අනුව මේ ජුදෙව් ප්‍රදේශවලින් අන්‍යජාතින්ගේ ප්‍රදේශ වෙත ඇතුළු වීම දැකිය හැකි විය.

විදේශීය ජුදෙව් සෙනඟ හෙබ්‍රව් නාමය සමඟ ග්‍රීක් නමකින් ද හැඳින්වීම සිරිතකි. මේ අනුව සාවුල් යනු හෙබ්‍රේව් නම වන අතර පාවුල් යනු ග්‍රීක් නම විය.

**ඉකෝනිය** : ජුදෙව්වන් සමහරෙක් හා ග්‍රීකයන් පිරිසක් බාර්ණබස් සහ පාවුල්ට ගල් ගැසීමට උත්සාහ කිරීම දැකිය හැකි ය. නමුත් නායකත්වය තුළ කිසිවකු තනි කළේ නැත. බාධක කරදර සිදු වුයේ යැයි තනි කර පළා ගියේ නැත. දුක වේදනාව බාධක හවුල් නායකත්වය තුළ මුහුණ දෙමින් එකිතර ව සේවයේ යෙදිණි.

**ලුස්ත්‍රාව** : කොරෙකු සුවපත් කළ නිසා දෙවිවරුන් යයි මල් මාලා දමා පිළිගැනිණි. නමුත් අන්තියෝකියෙන් හා ඉකෝනියෙන් ද ජුදෙව්වරු පැමිණ සෙනඟ ඇවිස්සීම නිසා සෙනඟ ඔවුන්ට ගල් ගසා පසු ව මැරුණේ යැ යි සිතා නගරයෙන් පිටතට ඇද දැමූහ.

විශේෂයෙන් ලුස්ත්‍රාවේ හවුල් නායකත්වය තුළින් හැකියාවකින් වෙනත් හැකියාවක් ඔප මට්ටම් වීම දැකිය හැකි ය. මේ මඟින් හවුල් නායකත්වය තුළින් අභියෝගවලට අර්ථාන්විත ව මුහුණ දිය හැකි විය. (වැඩි විස්තර සඳහා ක්‍රියා 14 : 08 20 දක්වා කියවන්න.)

සැ : යු
පාවුල් දක්ෂ කථිකයකු නිසා ඔහුට හෙර්මීස් කියා ද බාර්ණබස්ට සියුස් කියා ද ඇමතීම අනුව ඔවුන්ගේ විවිධත්වය තුළ ඒකත්වයෙන් හවුල් සේවයේ සාර්ථකත්වය පෙන්නුම් කරයි. විවධ දක්ෂතා එකතු වීමෙන් හවුල් නායකත්වයේ විශිෂ්ඨ ප්‍රතිඵල පෙන්නුම් කළ හැකි ය.

මෙම ප්‍රධාන ස්ථානවල සිදුවීම් ද අනෙක් සෑම සිදුවීමක් ද සලකා බැලීමේ දී හවුල් නායකත්වයේ ඵලදායිත්වය පෙනේ.

පළමු ගමන අවසානයේ දී නැවත අන්තියෝකියට පැමිණ වාර්තා කිරීමෙන් හවුල් නායකත්ව වගකීම පෙන්වයි.

එසේ ම ජෙරුසලම් මන්ත්‍රණ සභාව (ක්‍රියා : 15 ) තුළ අදහස් බෙදා ගැනීම හවුල් නායකත්වයෙහි විශේෂ ලක්ෂණයකි. මෙහි දී අදහස් උදහස් බෙදා ගැනීම විවෘත විය. සියළු දෙනාට ම තම අත්දැකීම් අනුව අදහස් ප්‍රකාශ කිරීමට හැකි විය. ඒ නිසා බාර්ණබස්, පේදුරු පාවුල් විජාතීන් අතර සේවයේ අත්දැකීම ප්‍රකාශ කළෝ ය. පරිසි කණ්ඩායම් සමහරෙක් ද තම අදහස් ප්‍රකාශ කළහ. ඒ අනුව තර්ක විතර්කවලින් පසු ව හවුල් නායකත්වයෙන් තීරණවලට එළඹිණි. ඒ අනුව චර්මඡේදනය අවශ්‍ය ම නැත. ගැළවීම දේව වරප්‍රසාදයික යුදෙව් කිතුනුවන් හා විජාතික කිතුනුවන් අතර සම්බන්ධතාවය රැකීම සඳහා කටයුතු කිරීමට තීරණ ගැනිණි. ඒ අනුව පහත දේවලින් පමණක් වැලකීම වැදගත් යැයි තීරණය කෙරිණි.

1. දේව රූප වන්දනාව
2. ලිංගික දුරාචාරය
3. බොටුව මිරිකා මැරූ සතුන්ගේ මස් අනුභවය
4. ලේ ආශ්‍රිත මස් අනුභවය

යන ඒවා ය.

## ජෙරුසලම් මන්ත්‍රණ සභාව ( ක්‍රියා : 15 )

ඒ කුමක් ද?
කුමක් කළේ ද?

ගැළවීම ලැබීමට චර්මඡේදනය අවශ්‍ය ම යි සමහරු ඉගැන්වූ හ.

↓

ප්‍රේරිතයන් හා සභා මූලිකයන් විමසීමට ජෙරුසලමට පැමිණීම.

↓

හවුල් නායකත්වය තුළ ක්‍රියා කිරීම

↑ පරිසි කණ්ඩායමේ සමහරෙක්

↑ බාර්ණබස් — පේදුරු — පාවුල් — විජාතීන් අතර සේවය හා ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරිත්වය

❖ **තීරණය**

චර්මඡේදනය අවශ්‍ය නැත. ගැළවීම දේව වරප්‍රසාදයකි.

වැළකීම
1. දේව රූප වන්දනාව
2. ලිංගික දුරාචාරය
3. බොටුව මිරිකා මැරූ සතුන්ගේ මස් අනුභවය
4. ලේ ආශ්‍රිත මස් අනුභවය

(යුදෙව් කිතුනුවන් හා විජාතික කිතුනුවන් අතර සම්බන්ධතාව රැකීම සඳහා. )

එසේ ම හවුල් නායකත්වයේ සාමුහික වගකීමට අපි බැඳෙමු.

## ❖ ඇගයීම

01. අද නායකයන්ට " පාවුල් හා බාර්ණබස්ගේ හවුල් නායකත්වය අභියෝග කරනු ලබයි " යන්න පිළිබඳ ව සඟරාවකට ලිපියක් සකස් කරන්න.

02. පන්තිය තුළ, නිවස තුළ ,හවුල් නායකත්වයෙන් වැඩ කළ යුතු අවස්ථා දක්වන්න.

03. වගුව පුරවන්න.

| ස්ථානය | සිද්ධිය | පාඩම |
|---|---|---|
| සිරියාවේ අන්තියෝකිය | සේවය ආරම්භ කිරීම | ශුද්ධාත්ම මඟ පෙන්වීම මත, ගෝලයන් දෙදෙනකු විශේෂ සේවයකට වෙන් කිරීම |
| පාපස් | | |
| පිසිදියේ අන්තියෝකිය | | |
| ලුස්ත්‍රාව | | |